**ඇල්පිටිය ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඇල්පිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්‍රාම වැටුප් දායක වියදම රු.87,970 ක් හා ප්‍රාග්ධන වියදම් රු.460,424 ක් ගිණුම් ගතකර නොතිබුණි. | ඉදිරියේ දී නිවැරදිව ගිණුම් ගත කරන බව. | නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) | අම්බන උප කාර්යාලයේ අවසාන තොග ශේෂය රු.131,890 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.362,264 ක් වූ පොලී ආදායම අධිකතා ඌණතා ගිණුමට හර කිරීමෙන් ස්ථාවර තැන්පතු වටිනාකම එම ප්‍රමාණයෙන් අඩු වී තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | ආයුර්වේද තොග මිලදී ගැනීම් රු.3,879,545 ක් ආධාර ලැබීමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඉ) | ඉදිරියට ලද වරිපනම් බදු ආදායම රු.112,485 ක් වුවද, එය රු.104,903 ක් ලෙස ගිණුම් ගතකර තිබුණි. | - එම - | - එම - |
| (ඊ) | 2022 වර්ෂයේ අවසන් දිනට විදුලි තොග ශේෂය රු.33,120 කින් වැඩියෙන් දක්වා තිබුණි. | - එම - | - එම - |

### 1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්ා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 05 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.23,231,115 ක වෙනසක් පැවතිණි. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කරන බව. | අසමානතාවයන් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.759,000 ක් වූ ගිණුම් විෂයයන් 02 ක් සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිරවුල් කිරීමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වන වගන්තිය | සභාව සතු දිග කි.මී.393.36 ක් වන මාර්ග 425 ක් පනත ප්‍රකාරව මාර්ග ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර නොතිබුණි. | මාර්ග ඉන්වෙන්ට්‍රිය සකස් කිරීමෙන් අනතුරුව ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන බව. | මාර්ග ගැසට් නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කළ යුතුය. |
| (ආ) | 1988 පළාත් සභා මූල්‍ය හා පරිපාලන රීති 476 හා 477 | වාර්ෂිකව සභාව සතු වාහන 20 ක් සඳහා වාර්ෂික සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | 2024 වසර සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන බව. | වාහන සම්බන්ධයෙන් වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ඇ) | කුඩා පරිමාණ දූෂකාරක කර්මාන්ත / ක්‍රියාවලි සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම පිළිබඳ පළාත් පාලන ආයතන සඳහා මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.7.1 මාර්ගෝපදේශය. | පරිසර ආරක්ෂණ බලපත්‍ර උපරිම වලංගු කාලය අවුරුදු 03 ක් වූ අතර, වලංගු කාලය අවසන් වූ ආයතන 25 ක් පැවතුණි. | අදාළ ආයතනවල හිමිකරුවන් සඳහා ලිපි යොමු කර ඇති බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.15,458,720 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.38,869,036 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 7,466,500 | 5,195,094 | 4,870,825 | 19,117,607 | 5,946,500 | 5,105,210 | 4,166,434 | 18,793,338 |
| කුලී | 3,460,000 | 3,587,670 | 5,258,828 | 2,354,064 | 3,109,200 | 4,798,850 | 5,628,046 | 4,025,222 |
| බලපත්‍ර ගාස්තු | 852,000 | 2,157,390 | 2,070,940 | 100,000 | 716,500 | 1,209,894 | 1,236,244 | 13,550 |
| වෙනත් ආදායම් | 13,843,500 | 13,037,176 | 13,156,216 | 804,837 | 7,193,000 | 12,902,697 | 12,994,657 | 923,877 |
| | 25,622,000 | 23,977,330 | 25,356,809 | 22,376,508 | 16,965,200 | 24,016,651 | 24,025,381 | 23,755,987 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ ආදායම රු.23,755,987 ක් වූ අතර, වර්ෂ අවසානයට එම මුළු හිඟ ආදායම රු.22,376,508 ක් විය. වර්ෂය අවසානයට හිඟ වරිපනම් බදු ශේෂය තුළ පැවති රු.5,856,963 ක් වූ ශේෂ 1702 ක් හා හිඟ කඩ කුලී ශේෂය තුළ පැවති රු.2,176,592 ක් වූ ශේෂ 16 ක් වසර 03 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒවා විය. | හිඟ ආදායම රැස් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම මඟින් මෙම පවතින හිඟය ද නිරවුල් කරන බව හා වසා දමා තිබිය දී බිල් කළ කඩ කාමරවල රු.2,176,382 ක මුදල කපා හැරීම සඳහා යොමුකර ඇති බව. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හිඟ කඩ කුලී නොගෙවන හා ව්‍යාපාර කටයුතු සිදු නොකරන ප්‍රාදේශීය සභාව සතු කඩ කාමර 15 ක් 2022 මාර්තු මස මුද්‍රා තබා තිබුණු අතර, එම කඩ කාමර අළුත්වැඩියා කිරීමට කටයුතු නොකිරීමෙන් අදාළ ගොඩනැගිලි විනාශ වෙමින් පැවතුණි. | පැරණි ගොඩනැගිල්ලක් බැවින් අළුත්වැඩියා කළ නොහැකි මට්ටමකට අබලන්ව පවතින බව. | සභා දේපලවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සභාව සතු කඩ කාමර 19 ක් සහිත ගොඩනැගිලි දෙකක් දුර්වල තත්ත්වයේ පවතින බැවින් අළුත්වැඩියා කටයුතු කල පසු තක්සේරු වටිනාකම වාර්තා කරන බව රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් දන්වා තිබුණ ද, එම කඩ කාමර අළුත්වැඩියා නොකිරීමෙන් සභාවට කඩ කාමර බදු දී උපයාගත හැකිව තිබූ ආදායම් අහිමි වී තිබුණි. | එම ගොඩනැගිල්ල සම්පූර්ණයෙන් ඉවත් කර වර්තමාන වෙළඳපොලට සරිලන පරිදි නවීන අංගෝපාංගයන්ගෙන් සමන්විත සුපිරි වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට සභා සම්මත කරගෙන ඇති බව. | කඩ කාමර අළුතින් ඉදිකර සහා ආදායම් ඉහල නංවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.6,996,965 ක් හා උසාවි දඩ රු.998,084 ක් විය. | හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ශේෂ අයකර ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකායර්ක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සති පොලවල් දෙකක් රු.757,552 ක් වැයකර ඉදිකර තිබුණද වසර 06 ක සිට ක්‍රියාත්මක වීමෙන් තොරව අක්‍රීයව සහා බල ප්‍රදේශයේ පැවතිණි. | වෙළෙඳුන් ඉදිරිපත් නොවීම මත අසාර්ථක වී ඇති බව. | සභා දේපල මඟින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 56 ක හිමිකම තහවුරු කර ගැනීම සඳහා ඔප්පු සභාව තුළ නොතිබූ අතර, එම ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සභාව සතු ඉඩම්වල අයිතිය නිරවුල් කර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | සභාව සතු ඉඩම් වල අයිතිය නිරවුල් කරගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වටිනාකම රු.11,131,501 ක් වූ වාහන 06 ක් හා වටිනාකම හඳුනාගත නොහැකි වාහන 02 ක් මාස 04 ත් වසර 08 ත් අතර කාලයක සිට නිශ්කාර්යව පැවතිණි. | අපහරණ කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බව. | නිශ්කාර්යයව පවතින වත්කම් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජයන්ති මාවත සහ පැලැන්දගොඩ පාර තාර යොදා සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ විෂය අංක 04 ට අදාළව යන්ත්‍ර භාවිතා කර පැරණි මාර්ගය ගලවා ඉවත් කිරීමේ දී වැඩ විෂය අංක 02 හි සඳහන් මාර්ගයේ දෙපස උස් වූ ස්ථාන කැපීම සඳහා ද එම යන්ත්‍රය භාවිතා කළහැකි බැවින් ඒ සඳහා මිනිස් ශ්‍රමයෙන් පස් කැපීමට අදාළව මිල අනුපාතය භාවිතා කිරීම නිසා රු.135,717 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මිළ ගණන් සම්බන්ධ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |
| (ආ) | පැති කාණුවල හැඩයම් වැඩ සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.259,885 ක් වැඩිපුර ගෙවා තිබුණි. | මිල ගණන් සම්බන්ධ දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස් විසින් පත් කරන ලද කමිටුවේ නිර්දේශ අනුව ඉදිරියේ දී කටයුතු කිරීමට නියමිත බව. | නියමිත මිල අනුපාත භාවිතා කළ යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සේවය අතහැර ගිය, විශ්‍රාම ගිය, සේවය අත් හිටවූ හා තොරතුරු සොයාගත නොහැකි නිලධාරීන් 07 දෙනෙකුගෙන් 2023 දෙසැම්බර් 31 දිනට රු.364,678 ක ණය ශේෂයක් අයවීමට පැවතුණි. | ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |